# සංගීතය පටිගත කර ගබඩා කිරීම සහ නැවත ශ්‍රවණය කිරීම

සංගීතය විශ්ව භාෂාවකි. අප රටේ පමණක් නොව ලෝකයේ සෑම රටකම ඉතා විශිෂ්ට සංගීත නිර්මාණ ඇත. එම ගීත පට ශ්‍රවණය කිරීමට හැකි වී ඇත්තේ තාක්ෂණික දියුණුව නිසා ය.

අතීතයේදී ගීත නිර්මාණය වුවත් එම ගීත ඇසීමට හැකි වූයේ ගායකයින් හා වාදකයින් එම සංගීත නිර්මාණ එම අවස්ථාවේදීම සජීවීව ඉදිරිපත් කිරීමෙන් පමණි.

මීට ශත **වර්ෂයකට** ප්‍රථම එනම් **1888 එමිල් බර්ලින්** විසින් නිර්මාණය කළ ග්‍රැමෆෝනය හේතුවෙන් ලොව මුලින්ම සජීවීව ගැයූ ගීත නැවත ඒ අයුරින්ම ශ්‍රවණය කිරීමට හැකි විය.

මෙසේ සජීවී ගීත තැටිගත කර නැවත ශ්‍රවණය කිරීමේ උපකරණය මගින් තවත් සුවිශේෂී දෙයක් සිදුවිය. ඒ සංගීත ගබඩා කිරීම හා සංරක්ෂණය වීමයි. මෙය සංගීත ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට ප්‍රබල බලපෑමක් ඇති කරන ලදී.

එදා ග්‍රැමෆෝනයෙන් ආරම්භ කළ ගීත ගබඩා කිරීමේ හා සංරක්ෂණය කිරීමේ හා තාක්ෂණික දියුණුව වර්තමානය වන විට ඉතා ඉහළ තරග තරගකාරී දියුණුවක් ලබා ඇත.

අතීතයේ සිට වර්තමානය දක්වා සංගීත ගබඩා කිරීම හා නැවත ශ්‍රවණය කිරීමේ උපකරණ පිළිබඳ තොරතුරු කෙටියෙන් විමසා බලමු.

## ග්‍රැමෆෝනය

මෙහිදී හඬ ගබඩා කිරීමේදී තැටිය මත සියුම් ඇලි කැපෙයි. නැවත එම නාදය නිපදවීමට එම තැටිය කැරකැවීමට සලස්වා ඉදිකටු තුඩක් වැනි උප උපකරණයක් එම ඇලි මත ගමන් කරවීමත් සමග මලක හැඩයකින් යුක්ත වූ කොටසින් හඬ විහිදුවා හරියි.









# පූල් ටේප් (Pool Tape)

ග්‍රැමෆෝනයෙන් පසුව චුම්බක පටියක් මත හඬ ගබඩා කිරීමේ හා නැවත ශ්‍රවණය කිරීමේ තාක්ෂණික උපකරණයක් ලොවට හඳුන්වා දුනි. එය පූල් ටේප් නමින් හඳුන්වයි. බොහෝව විට සංගීත නිර්මාණ කටයුතු සඳහා මෙය භාවිතා විය.






# Audio cassette

චුම්බක පටි මත හඬ ගබඩා කිරීමේ තාක්ෂණය භාවිතා කරමින් 1970 දී පිලිප්ස් සමාගම විසින් ඕඩියෝ කැසට් ටේප් (Audio cassette )ලොවට හඳුන්වා දුනි. මෙය ඉතා ජනප්‍රිය වන්නට විය .









# DAT Tape

සංගීත නිර්මාණකරණයේ දී වෘත්තීය මට්ටමින් හඬ පටිගත කිරීමට තවත් චුම්බක පටි සහිත උපකරණයක් භාවිතා විය. එය DAT Tape ලෙස හඳුන්වයි. Digital audio tape මෙහිදී එක් එක් සංගීත භාණ්ඩ සඳහා තීරු(tracks) වෙන්කර ඇත. එය සංගීත සංයෝජනය සඳහා ඉමහත් පිටුවහලක් වේ.






# CD (compact disk)


Audio cassette tape එකෙන් පසුව 1982 දී හඳුන්වා දුන් CD (compact disk) 2000 වසර පසුව ලොව මවිත කරමින් ලොව  පුරා ජනප්‍රිය වන්නට විය. මෙහි සංගීතය ගබඩා වූයේ දත්ත වශයෙනි. මෙහි දත්ත කියවනු ලබන්නේ ලේසර් ආලෝක කදම්භයක් මගිනි. මේ නිසා ඉතා සියුම් හා ගැඹුරු නාද රටා ශ්‍රවණය කිරීමේ හැකියාව මින් ලැබුණි.






පසුව තාක්ෂණික  දියුණුවත් සමඟ CD තැටිය  MD. DVD , Blue ray වශයෙන් ධාරිතාවයෙන් වැඩි වූ තැටි ලෙස නිර්මාණය වන්නට විය. වර්තමානයේ සංගීතය ගබඩා කර ශ්‍රවණය කිරීමේ නවීනතම උපකරණය ලෙස Blue ray තැටි හැඳින්විය හැකිය.






# Hard disk( දෘඪ තැටි)

සංගීත නිර්මාණ  කටයුතු වලදී සහ සංගීත ගබඩා කරගැනීමේ කටයුතු වලදී වඩාත් සුදුසුම උපකරණය ලෙස වර්තමානයේ hard disk( දෘඪ තැටි) ප්‍රධාන තැනක් උසුලයි. මෙහි සංගීත නිර්මාණය දත්ත අයුරින් ගබඩා කර ගනී. නැවත ශ්‍රවණය කිරීම් සඳහා පරිගණක මෘදුකාංගයක් අවශ්‍ය වේ.





# memory card

වර්තමානයේ සංගීත නිර්මාණ ගබඩා කිරීම සහ ශ්‍රවණය කිරීමටත් තැනින් තැනට ගෙන යාමටත් කුඩා උපකරණ නිර්මාණය වී ඇත. ඒවා pen drive, SD card, mini SD, micro SD වැනි memory card ය.









## අන්තර්ජාලය (Internet)

ඉහත සඳහන් කළ උපාංග වලට අමතරව අන්තර්ජාලය සංගීත ගබඩා කිරීමේ සුවිශේෂී මෙවලමක් ලෙස හඳුන්වා දිය හැකියි. You tube , Google drive , web pages උදාහරණ ලෙස දැක්විය හැකිය.




Google Drive

YouTube

## <u>පැවරුම්</u>

1. සංගීත නිර්මාණ ගබඩා කර ගැනීමේ මුල්ම උපකරණය කුමක්ද?

2. සංගීත නිර්මාණ කටයුතු වලදී භාවිතා වන දත්ත ගබඩා කර ගැනීමේ සුවිශේෂී උපාංග මොනවාද?

3. වර්තමානයේ නවීනතම සංගීත ගබඩා කිරීමේ හා ශ්‍රවණය කිරීමේ උපකරණ මොනවාද?